# සී/ස රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතිය

# අයදුම්පත් කැඳවීම

සී/ස රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ 02/2019 චක්‍රලේඛන අනුව සුදුසුකම් සපුරන මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. සියලුම අයදුම්පත් 2020.08.27 දින හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් තනතුරු නාමය සඳහන් කර **"ගරු සභාපති, සී/ස රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතිය, රිකිල්ලගස්කඩ"** යන ලිපිනයට එවිය යුතුය.

ඔබ විසින් සනාථ කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය සමග අදාල සහතිකවල ඡායා පිටපත් එවිය යුතු අතර, එසේ පිටපත් නොමැතිව, සුදුසුකම් සනාථ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අදාල සහතිකවල ඡායා පිටපත් සමග මෑතකදී ගත් චරිත සහතික දෙකක් සහ පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකයද, වයස තහවුරු කිරීම සඳහා උප්පැන්න සහතිකයේ පිටපතක් සහ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්ද සමග සමිති බල ප්‍රදේශයේ ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට කැමැත්ත පළ කිරීමේ ප්‍රකාශයක්ද එවිය යුතුය.

දැනටමත් සමුපකාර සමිතියක සේවයේ නියුතු අයෙක් නම් සමිතිය මගින් ඉල්ලුම්පත් යොමු කල යුතු අතර, සමුපකාර සේවකයන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

## 1. S.E.M.L- 02:01 සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) II&I

- ➢ වැටුප් පරිමාණ අංකය : S.E.M.L - 02:01
- ➢ වැටුප් පරිමාණය : 22000-470X10 - 570 X 10 - 720 X10 = 39600/=
- ➢ වයස් සීමාව : 18 – 45
- ➢ සුදුසුකම් :

1. පිළිගත් විශ්වවිද්‍යාලයක ගණකාධිකරණය / වාණිජ/ කළමනාකරණය පිළිබඳ උපාධියක් හෝ උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණ / වාණිජ ඩිප්ලෝමාවක් තිබීම.

**හෝ**

2. වරලත් ගණකාධිකාරී ආයතනයේ අදියර II (Level-II) / මූල්‍ය ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ පූර්ණ සාමාජිකත්වය (A.A.T. - Level -II)

**හෝ**

3. S.E.M.L - 02:05 වැ. ප. අභ්‍යන්තර විගණක හෝ S.E.M.L - 02:06 වැ. ප. ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 05 කට නොඅඩු ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

4. ගණකාධිකරණය / බැංකු හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමාවක් සමග S.E.M.L - 02:05 වැ. ප. අභ්‍යන්තර විගණක හෝ S.E.M.L - 02:06 වැ. ප. ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 02 කට නොඅඩු ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

## 2. S.E.M.L 02:03 සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු) II&I

- ➢ වැටුප් පරිමාණ අංකය : S.E.M.L - 02:03
- ➢ වැටුප් පරිමාණය : 22000-470X10 - 570 X 10 - 720 X10 = 39600/=
- ➢ වයස් සීමාව : 18 – 45
- ➢ සුදුසුකම් :

1. පිළිගත් විශ්වවිද්‍යාලයක ආර්ථික විද්‍යා විෂය සහිත උපාධියක්.

**හෝ**

2. උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණ / වාණිජ ඩිප්ලෝමාව

**හෝ**

3. මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත බැංකු කළමනාකරණය/ ක්ෂුද්‍ර මූල්‍යකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමග S.E.M.L - 02:05 වැ. ප. අභ්‍යන්තර විගණක තනතුරක වසර 03 කට නොඅඩු ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම හෝ S.E.M.L - 02:06 වැ. ප. ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 04 කට නොඅඩු ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**ගරු සභාපති,**
**සී/ස. රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතිය,**
**රිකිල්ලගස්කඩ.**